**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/95**

මගේ අංකය: 1/543ඊ/02ඩී/02/94(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය ,කොළඹ 07.
1995.04.28 වෙනි දින

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>කාර්මික ශිල්පීය ශ්‍රේණිවල වැටුප්</u>**

කාර්මික ශිල්පීය ශ්‍රේණිවලට අයත් කම්කරු ශ්‍රේණියේ; කාර්මික ශිල්පි ශ්‍රේණිය (තේරීම් ශ්‍රේණිය), 1 පන්තිය 1 ශ්‍රේණිය සහ 1 පන්තිය 11 ශ්‍රේණිය වැටුප් සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

02. නව වැටුප් පරිමාණ පහත දක්වේ.

**<u>කම්කරු ශ්‍රේණිය:</u>**

කාර්මික ශිල්පි ශ්‍රේණිය (තේරීම් ශ්‍රේණිය)

| | |
|---|---|
| 1 පන්තිය 1 ශ්‍රේණිය | - රු.35640-6-x780-9x1200<br>-51120 |
| 1 පන්තිය 11 ශ්‍රේණිය | - රු.29400-5x660-11x780<br>-41280 |

03. මෙම ශ්‍රේණිවලට අයත් නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනයන් නොවෙනස්ව පවතින අතර, දැනට පවත්නා කාර්යක්ෂමතා කඩඉම් අනුරූපි වැටුප් පියවරවලදී ක්‍රියාත්මක වනු ඇත.

04. වැටුප් පරිවර්තනය පියවරින් පියවරට තැබීමේ පදනම මත කරනු ලැබේ.

05. මෙම චක්‍රලේඛයෙන් ක්‍රියාත්මක කරනු ලබන නව වැටුප් පරිමාණයන් නොතකා සංයුක්ත දීමනා, දුම්රිය බලපත්‍ර හිමිකම් අදාල නිලධාරීන්ගේ අංක 37/92 සහ 92.12.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි "1993 නව වැටුප්" මත වනු ඇත. වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් සහ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකර ගැනීමේ ප්‍රමාණ, අංක 37/92 හා 92.12.24 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දක්වෙන අදල නිලධාරීන්ගේ "1993 නව වැටුප්" අනුව නොවෙනස්ව පවතී. එහෙත් අදල නිලධාරීන්ගෙන් නව වැටුප් මත දායක මුදල් අය කරනු ලැබේ.

06. මෙම වැටුප් සංශෝධන 1995.01.01 දින සිට ක්‍රියාත්මක කෙරේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය